# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2020 ජනවාරි මස 09 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2020.01.13 දින නිකුත් කරන ලදී)**

## ඉඩම් සංවර්ධන (සංශෝධන)

(පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ පනත් කෙටුම්පතකි)

**ඉඩම් සංවර්ධන ආඥාපනත (464 වන අධිකාරය) සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

කෑගල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රිනී ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ඉඩම් සංවර්ධන (සංශෝධන)

### ඉඩම් සංවර්ධන ආඥාපනත (464 වන අධිකාරය) සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය.*

**1.** මේ පනත 2020 අංක දරන ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*464 වන අධිකාරයේ තෙවන උපලේඛනයේ සංශෝධනය.*

**2.** ප්‍රධාන ප්‍රඥප්තියේ තෙවන උපලේඛනයේ 1(ආ) වන රීතිය සහ 2 වන රීතිය පහත දැක්වෙන රීති ආදේශ කිරීම මගින් සංශෝධනය කරනු ලැබේ:—

"1(ආ). 72 වන වගන්තියේ දක්වා ඇති කරුණුවලට හිමිකම දැරීම බලපත්‍රධාරියාගේ ඥාතීන් හෝ පහත දක්වා ඇති වගුවේ ඇති අනුපිළිවෙල අනුව වන හිමිකරුට පැවරේ. කිසියම් පිරිසක් අතර එක් අයෙකුට වැඩියෙන් ඥාතීන් ඇති අවස්ථාවක වයසින් බාල අයෙකුට වඩා වයසින් වැඩි කෙනෙකුට වැඩි හිමිකම ලැබේ:

එසේ වුව ද, වයසින් වැඩි පුද්ගලයාට වඩා වෙනත් පුද්ගලයකු ඉඩම සංවර්ධනය කර ඇති අවස්ථාවක මෙම නීතිය යටතේ ප්‍රමුඛත්වය අත් නොවේ.

වගුව:

(i) දරුවන්;

(ii) මුණුපුරු මිණිපිරියන්;

(iii) දෙමාපියන්;

(iv) සහෝදර සහෝදරියන්;

(v) පියාගේ සහ මවගේ සහෝදර සහෝදරියන්;

(vi) පියාගේ සහ මවගේ සහෝදර සහෝදරියන්ගේ දරුවන්.

මේ නීතිය තුළ "නෑදෑයන්" යන්නෙන්, විවාහය නිසා නොවන ලේ ඥාතියා හැඳින්වෙන අතර, "දරුවන්" යන්නෙන් හදාවඩාගත් දරුවන් ද ඇතුළත් වේ.

(2) 1 වන රීතිය තුළ ඇති වගුවේ සඳහන් ඥාති පිරිසක් යන්නෙන් සමාන වයසේ හෝ වෙනස් වයස්වල පුද්ගලයන් දෙදෙනකු හෝ වැඩි දෙනකු අයිතිවාසිකම් පෑමට කැමැත්ත හා හිමිකම ඇති අවස්ථාවක, මෙම පුද්ගලයන් අතරින් ඉඩම සංවර්ධනය කිරීම සිදු කළ පුද්ගලයන්ට හිමිකම ලබා ගැනීමට ප්‍රාදේශීය ලේකම්ට ඔවුන් අතරින් අය නම් කළ හැකි වේ:

එසේ වුව ද, එක් පුද්ගලයකුට වඩා වැඩි පිරිසක් නම් කරන අවස්ථාවක, බලපත්‍රයේ හෝ ප්‍රදාන පත්‍රයේ සඳහන් කොන්දේසි ප්‍රකාරව අනුප්‍රාප්තිකයා නම් කිරීම කළ යුතු ය.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.